253005

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1994 අංක 13 දරන වාරිමාර්ග (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1994 ජූනි මස 07 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1994 ජූනි මස 10 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක.

මිල : ශත 60 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1994 අංක 13 දරන වාරිමාර්ග (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1994 ජූනි මස 07 වන දින]

එල්. ඩී.—ඕ. 74/90

**වාරිමාර්ග ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඬු නාමය.**

1. මේ පනත 1994 අංක 13 දරන වාරිමාර්ග (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**453 වන අධිකාරයේ "ගොවි කාරක සභාව" යන යෙදුම වෙනුවට "ගොවි සංවිධානය" යන්න ආදේශ කිරීම.**

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) වාරිමාර්ග ආඥාපනතේ යම් වගන්තියක "ගොවි කාරක සභාව" යන යෙදුම යෙදෙන කවර තැනක වුවද ඒ යෙදුම වෙනුවට, "ගොවි සංවිධානය" යන යෙදුම ආදේශ කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 2අ සහ 2ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම.**

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා පිළිවෙලින් ප්‍රධාන ප්‍රඥප්තියේ 2අ සහ 2ආ වගන්ති වශයෙන් බලපැවැත්විය යුතු ය:—

"ඇතැම් ඉඩම් වාරිමාර්ග බද්දෙන් නිදහස් කිරීමේ බලය.

2අ. අන්තර් පළාත් වාරිමාර්ග සහ ඉඩම් සංවර්ධන යෝජනා ක්‍රමයක බෙදා හැරීමේ ඇළමාර්ග ක්‍රමය මුළුමනින්ම හෝ එහි කොටසක් මෙහෙයුම හා නඩත්තුව භාරගෙන ඇති යම් ගොවි සංවිධානයක් විසින් ඒ සංවිධානයේ බලසීමාව ඇතුළත ඇති ඉඩම්, 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පනවන ලද වාරිමාර්ග බදු ගෙවීමෙන් නිදහස් කරන ලෙස ඉල්ලුම් කරන අවස්ථාවක, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, ඒ නියමයේ සඳහන් කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා සහ එසේ නියම කරනු ලැබිය හැකි යම් නියම හා කොන්දේසි වලට යටත්ව නියමයේ සඳහන් යම් ප්‍රදේශයක් ඇතුළත පිහිටි ඉඩම් 2 වන වගන්තියේ (1) උපවගන්තිය යටතේ පනවන ලද වාරිමාර්ග බදු ගෙවීමෙන් නිදහස් කළ යුතු ලෙස ඒ ඉඩම් පිහිටා ඇත්තේ යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් ඇතුළතද ඒ කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් විධාන කරනු ලැබිය හැකි ය.

ගොවි සංවිධානය විසින් අය බද්දක් පැනවිය යුතු බව.

2ආ. (1) බෙදා හැරීමේ ඇළමාර්ග ක්‍රමය සහ 2අ වගන්තිය යටතේ වාරිමාර්ග බදු ගෙවීමෙන් නිදහස් කරන ලද්දා වූ ද බලසීමාව ඇතුළත පිහිටියා වූ ද ඉඩම් මුළුමනින්ම හෝ එහි කොටසක් මෙහෙයවීම හා නඩත්තුව භාරගත් යම් ගොවි සංවිධානයක් විසින්, බෙදා හැරීමේ ඇළමාර්ග ක්‍රමය හා ඒ ප්‍රදේශයේ ගොවි ජනතාවට ප්‍රයෝජනවත්වන වෙනත් යම් වැඩක් මෙහෙයවීමේ හා නඩත්තුවේ වියදම පියවීම සඳහා ඒ ඉඩම් සම්බන්ධයෙන්

සම් මුදල් ප්‍රමාණයක අයබද්දක් පනවා අය කර ගනු ලැබිය හැකි ය. ලැබුම්කරුවකු හෝ අඳ ගොවියකු හෝ අයිතිකාර ගොවියකු ඇත්තා වූ ඉඩමක් සම්බන්ධයෙන් පනවන ලද අයබද්ද අවස්ථා වෝචිත පරිදි, ඒ ලැබුම්කරු හෝ අඳ ගොවියා හෝ අයිතිකාර ගොවියා විසින් ගෙවනු ලැබිය යුතු ය.

(2) 2 වන වගන්තියේ (4) වන උපවගන්තියේ විධිවිධාන, (1) වන උපවගන්තිය යටතේ පනවන ලද අය බද්දක් සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(3) යම් ඉඩමක් සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ යම් අය බද්දක් පනවනු ලැබූ අවස්ථාවක, ඒ ඉඩම පිහිටියේ යම් ගොවි සංවිධානයක බලසීමාව ඇතුළත ද ඒ ගොවි සංවිධානය විසින්, (1) වන උපවගන්තිය යටතේ යම් අය බද්දක් ගෙවීමට බැඳී ඇති තැනැත්තා වෙත අය බද්දේ මුදල පිළිබඳ ලිඛිත දැන්වීමක් කරනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ දැන්වීමක් කරන ලද්දේ යම් තැනැත්තකු වෙතද, ඒ දැන්වීමේ සඳහන් කාලසීමාව ඇතුළත ඊට අනුකූලව කටයුතු කිරීම ඒ සෑම තැනැත්තකුගේම ක[illegible]යය විය යුතු ය.

(5) ඉඩමකට අදාළව මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පනවන ලද අය බද්ද ගෙවීම පැහැර හරිනු ලැබ ඇති අවස්ථාවක, අය බද්ද පනවන ගොවි සංවිධානය විසින් ඒ ඉඩම පිහිටා ඇත්තේ යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් ඇතුළත ද ඒ කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම්වරයා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතු අතර, ප්‍රාදේශීය ලේකම්වරයා විසින් මේ ආඥාපනතේ VII වන කොටසේ විධිවිධාන සලස්වා ඇති පරිදි අය බද්ද අයකර ගැනීම සඳහා ඒ ආකාරයෙන්ම කටයුතු කරගෙන යා යුතු ය. තවද ඒ කොටසේ විධිවිධාන ඒ අය බද්ද අයකර ගැනීම සඳහා අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය. ඒ ගෙවීම පැහැර හරින ලද්දේ යම් ගොවි සංවිධානයක් සම්බන්ධයෙන් ද ඒ ගොවි සංවිධානය වෙත ප්‍රාදේශීය ලේකම්වරයා විසින් එසේ අයකර ගන්නා ලද අය බද්ද යවනු ලැබිය යුතු ය.

(6) (1) වන උපවගන්තිය සහ (5) වන උපවගන්තිය යටතේ ගොවි සංවිධානයක් විසින් අය කර ගන්නා ලද මුදල් (1) වන උපවගන්තියේ සඳහන් කාර්ය සඳහා ඒ ගොවි සංවිධානය විසින් යොදාගනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ II වන කොටසෙහි අලුත් ශීර්ෂයක් ඇතුළත් කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ II වන කොටසේ 5 වන වගන්තියට ඉක්බිතිවම, පහත දැක්වෙන අලුත් ශීර්ෂය ඇතුළත් කරනු ලැබේ :—

"ව්‍යාපෘති කළමනාකරණ කමිටු"

ප්‍රධාන ප්‍රඥප්තියේ 5අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියට ඉක්බිතිවම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය, ඒ ප්‍රඥප්තියේ 5අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

"නිශ්චිත මහා වාරිමාර්ග වැඩ සම්බන්ධයෙන් ව්‍යාපෘති කළමනාකරණ කමිටු.

5අ. (1) වාරිමාර්ග විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් විසින් නිශ්චය කරනු ලැබූ අන්තර් පළාත් වාරිමාර්ග හා ඉඩම් සංවර්ධන යෝජනා ක්‍රමයක කොටසක් වන සෑම මහා වාරි මාර්ග වැඩ සම්බන්ධයෙන්ම පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ව්‍යාපෘති කළමනාකරණ කමිටුවක් තිබිය යුතු ය :—

(අ) කමිටුවේ ගොවි නියෝජිත සංඛ්‍යාව, කමිටු වේ මුළු සාමාජික සංඛ්‍යාවෙන්, සියයට පනහකට නොඅඩුවන සේ ඒ ප්‍රදේශ යේ ගොවි සංවිධානවල නියෝජිතයන් අතුරෙන් අවශ්‍ය යම් නියෝජිත සංඛ්‍යා වක් ;

(ආ) කමිටුවේ සභාපති හෝ ලේකම් වශයෙන් ක්‍රියා කළ යුතු, වාරිමාර්ග විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන ව්‍යාපෘති කළමනාකාරවරයෙක් ;

(ඇ) පහත දැක්වෙන එක් එක් නිලධරයා විසින් පත් කරන ලබන නියෝජිතයෙක් :—

(i) වාරිමාර්ග අධ්‍යක්ෂ,

(ii) ඉඩම් කොමසාරිස්,

(iii) ගොවිජන සේවා කොමසාරිස්,

(iv) කෘෂිකර්ම අධ්‍යක්ෂ, සහ

(v) සමූපකාර සංවර්ධන කොමසාරිස්.

(ඈ) වාරිමාර්ග විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වෙනත් යම් අදාළ නියෝජිත ආයතනවලින් නියෝ ජිතයන් ;

(ඉ) ඒ වාරිමාර්ග වැඩ පිහිටියා වූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හෝ කොට්ඨාශවල ප්‍රාදේශීය ලේකම්වරයා හෝ ලේකම් වරයන්.

(2) අවශ්‍ය වන තාක් දුරට සහ කෙසේ වුව ද එක් එක් වගා කන්නය ආරම්භ වීමට පෙර, කමිටුවේ රැස්වීමක් ව්‍යාපෘති කළමනාකරණ කමිටුවේ සභාපති විසින් කැඳවනු ලැබිය යුතු ය.

(3) අනු ව්‍යාපෘති මට්ටමින් වඩා හොඳ ව්‍යාපෘති සම්බන්ධීකරණයක් අවශ්‍ය යයි ව්‍යාපෘති කළමනාකරණ කමිටුවේ මතය වන්නා වූ අවස්ථාවක, අනු ව්‍යාපෘති කළමනාකරණ කමිටු පිහිටුවීමේ බලය ව්‍යාපෘති කළමනාකරණ කමිටුවට ඇත්තේ ය. ඒ අනු ව්‍යාපෘති කමිටුවක මූලසුන කමිටුවේ ගොවි සංවිධානවල නියෝජිතයකු විසින් දරනු ලැබිය යුතු ය.

(4) ව්‍යාපෘති මට්ටමින් සහ අනු ව්‍යාපෘති මට්ටමින් සියලු ව්‍යාපෘති කළමනාකරණ කටයුතු සම්බන්ධීකරණය කිරීම ව්‍යාපෘති කළමනාකරණ කමිටුවේ කාර්යය වන්නේ ය.

(5) එක් එක් වගා කන්නය ආරම්භ වීමට පෙර (මෙහි මින්මතු "පෙර වගා රැස්වීම" යනුවෙන් සඳහන් කරනු ලබන) විශේෂ රැස්වීමක් ව්‍යාපෘති කළමනාකරණ කමිටුව විසින් කැඳවනු ලැබ, වගාවට අදාළ පහත දැක්වෙන යම් කරුණු පිළිබඳව ඒ වාරිමාර්ග වැඩ පිහිටා ඇත්තේ යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් ඇතුළතද ඒ කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම්වරයා වෙත හෝ ඒ වාරිමාර්ග වැඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ එකකට වැඩි ගණනක පැතිරී ඇත් නම්, දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිර්දේශ කරනු ලැබිය හැකි ය :—

(i) බිම් සෑම, වැපිරීම සහ අස්වනු නෙළීම ඇතුළු වගා කටයුතු ආරම්භ කිරීමේ දිනය ;

(ii) කන්නය සඳහා වූ වගා රටාව ;

(iii) වාරිමාර්ග වැඩ සහ 11 වන වගන්තියේ (1) සහ (2) වන උපවගන්ති යටතේ සාදන ලද රීති ක්‍රියාත්මක කිරීමට අදාළ වෙන යම් කරුණු වාර්ෂිකව පවත්වා ගෙන යාම සඳහා කටයුතු පිළියෙළ කිරීම,

(6) (5) වන උපවගන්තිය යටතේ ව්‍යාපෘති කළමනාකරණ කමිටුවේ නිර්දේශ ලැබුණු විට, අවස්ථාවෝචිත පරිදි, ප්‍රාදේශීය ලේකම්වරයා හෝ දිස්ත්‍රික් ලේකම්වරයා විසින් (මෙහි මින්මතු "වගා රැස්වීම" යනුවෙන් සඳහන් කරනු ලබන) ව්‍යාපෘති කළමනාකරණ කමිටුවේ විශේෂ රැස්වීමක් කැඳවනු ලැබිය යුතු අතර, එවිට, 11 වන වගන්තියේ (5) වන උපවගන්තිය මගින්, ජලය සැපයිය හැකි ප්‍රදේශයක් ඇතුළත ඉඩම් ලැබුම්කරුවන්, වගාකරුවන් හෝ අයිතිකරුවන් වෙත පැවරී ඇති

බලතල ව්‍යාපෘති කළමනාකරණ කමිටුව විසින් ඒ රැස්වීමේ දී ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය. අවස්ථාවෝචිත පරිදි, ප්‍රාදේශීය ලේකම්වරයා හෝ දිස්ත්‍රික් ලේකම්වරයා විසින්, ස්වකීය මතය අනුව සහභාගිත්වය ප්‍රයෝජනවත් යයි හැඟෙන යම් තැනැත්තකු ඒ රැස්වීමට කැඳවනු ලැබිය හැකිය :

එසේ වුවද, ව්‍යාපෘති කළමනාකරණ කමිටුවේ ගොවි සංවිධානවල නියෝජිතයන් අතුරෙන් යටත් පිරිසෙයින් තුනෙන් දෙකක්වත් ඒ රැස්වීමට පැමිණියහොත් මිස, එවැනි යම් රැස්වීමක් වලංගු ලෙස නොසැලකිය යුතු ය.

(7) (6) වන උපවගන්තියේ සඳහන් රැස්වීමකදී ගණපූරණය නොමැතිවීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා, 11 වන වගන්තියේ (5) වන උප වගන්තියේ (අ) ඡේදය හෝ (ඇ) ඡේදය යටතේ තීරණයකට එළඹි නොමැති අවස්ථාවක, ඒ තීරණය ගැනීමේ බලය, අවස්ථාවෝචිත පරිදි, ඒ රැස්වීම කැඳවූ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් හෝ දිස්ත්‍රික් ලේකම්වරයා විසින් හෝ ක්‍රියාත්මක කළ යුතු ය.”.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි “සෑම මහා වාරිමාර්ග වැඩක් සම්බන්ධයෙන්ම” යන වචන වෙනුවට, “5අ වගන්තිය යටතේ ව්‍යාපෘති කළමනාකරණ කමිටුවක් පත් කරන ලද්දේ යම් වාරිමාර්ග වැඩක් සම්බන්ධයෙන් ද එවැනි වාරිමාර්ග වැඩක් නොවන සෑම මහා වාරිමාර්ග වැඩක් සම්බන්ධයෙන්ම” යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියේ (3) වන උපවගන්තියේ “1958 අංක 1 දරන කුඹුරු පනතේ 38 වන වගන්තිය යටතේ ක්‍රියා කිරීම සඳහා කොමසාරිස් වෙත” යන වචන සහ ඉලක්කම් වෙනුවට “කොමසාරිස් වෙත” යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 118 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 118 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) “ගොවි කාරක සභාව” යන අර්ථකථනය අත් හැරීමෙන් ; සහ

(ආ) “දිසාපති” යන අර්ථ කථනයට පෙරාතුවම පහත දැක්වෙන අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

‘“ගොවි සංවිධානය” යන්නෙන්, 1979 අංක 58 දරණ ගොවිජන සේවා පනත යටතේ ගොවිජන සේවා කොමසාරිස් වෙත ලියාපදිංචි කරන ලද ගොවි සංවිධානයක් අදහස් වේ;’.

9. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්. එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.